# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ගුණරතන ජාත්‍යන්තර පදනම
## (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ගුණරතන ජාත්‍යන්තර පදනම සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
විසින් 2016 ජනවාරි මස 26 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 දෙසැම්බර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[67 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## ශ්‍රී ගුණරතන ජාත්‍යන්තර පදනම
## (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ගුණරතන ජාත්‍යන්තර පදනම
## සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"ශ්‍රී ගුණරතන ජාත්‍යන්තර පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී පදනමට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2016 අංක    දරන ශ්‍රී ගුණරතන ජාත්‍යන්තර පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ගුණරතන ජාත්‍යන්තර පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ගුණරතන ජාත්‍යන්තර පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරණු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ගුණරතන ජාත්‍යන්තර පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකිය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහාද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) බුදු සසුනේ ව්‍යාප්තිය සහ ආරක්ෂාව සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම;

(ආ) බෞද්ධ දහම් පාසල් පිහිටුවීමට ආධාර දීම සහ ඒ සඳහා මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම;

(ඇ) සමාජ සාරධර්ම සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම;

(ඈ) සමාජ අසහනය තුරන් කිරීම සඳහා සක්‍රීය වන්නා වූ ආයතන ස්ථාපනය කිරීම;

(ඉ) දරිද්‍රතාව දුරු කිරීම සඳහා වූ විධිමත් සහ ඵලදායි වැඩසටහන් සම්පාදනය කිරීම;

(ඊ) ශ්‍රී ලංකාවට පමණක් ආවේණික භෞතික හා දැනුම් සම්පත් භාවිතයෙන් සමාජ සුභසාධනය සහ සංවර්ධනය සඳහා කටයුතු සංවිධානය කිරීම;

(උ) ජාතික හා සාමාජික වශයෙන් මානව සමාජය තුළ අන්‍යෝන්‍ය අවබෝධය සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම;

(ඌ) ශ්‍රී ලංකාව තුළ ප්‍රජා සුභසාධන, අධ්‍යාපනික හා සමාජ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමෙහි නිරත වීම;

(එ) අධ්‍යාපනය, සෞඛ්‍ය, ක්‍රීඩා, සංස්කෘතික අංග හා කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම සහ දැනුම දියුණු කිරීම, ව්‍යාප්ත කිරීම, ප්‍රචාරය කිරීම සඳහා ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව, ත්‍යාග, පරිත්‍යාග, මූල්‍යාධාර සැපයීම සහ ආයතන පිහිටුවීම;

(ඒ) ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සහ පාරම්පරික ඥානයට අයත් විෂය ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීම සහ ආයතන පිහිටුවීම;

(ඔ) පරිසරය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘති ආරම්භ කොට පවත්වාගෙන යාම;

(ඕ) දේශීය බෙහෙත් වර්ග නිෂ්පාදනයට අවශ්‍ය ඖෂධ පැළෑටි, ගස්වැල් සහ වෙනත් වගාවන් ඇති කිරීම සහ පාලනය කර පවත්වාගෙන යාම;

(ක) ඖෂධ උයන් සහ ගෙවතු වගා ඇති කිරීම සහ ඒ සඳහා ආධාර උපකාර කිරීම;

(ග) ආයුර්වේද බෙහෙත් වර්ග ගැනීම, බෙදා හැරීම, අලෙවි කිරීම සහ අලෙවි හල් ඇති කිරීම සහ ඒවා පාලනය කර පවත්වාගෙන යාම;

(ජ) ආයුර්වේද බෙහෙත් වර්ග පිටරටින් ගෙන්වීම, පිටරට යැවීම සහ එම කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම;

(ට) විදේශ සිසුන් සහ දේශීය සිසුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, පිටරට ශිෂ්‍යත්ව සඳහා සිසුන් පිටත් කර යැවීම සහ ඒ සම්බන්ධ කටයුතු කිරීම;

(ඩ) විවිධ භාෂා පිළිබඳව, විවිධ විෂයන් පිළිබඳව විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යාපනයක් ලබා දී සහතික නිකුත් කිරීම හා ඒ හා සම්බන්ධ ආයතන පිහිටුවීම;

(ණ) දෘෂ්‍යාබාධිත, ශ්‍රව්‍යාබාධිත, අංගවිකල, අනාථ දරුවන් සහ වැඩිහිටියන්, සුව නොවන රෝගාබාධයන්ගෙන් පීඩිත සහ මන්ද මානසික තත්ත්ව ඇති අය නගාසිටුවීමට ආධාර දීම සහ ඒ සඳහා මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම;

(ත) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පමුණුවාලීම පිණිස මෙම ආයතනයට අනුබද්ධ ආයතන පිහිටුවා ඒවා මැනවින් පවත්වාගෙන යාම හා එයට අවශ්‍ය වෙනත් කටයුතු ඉටු කිරීම;

(ද) යම් කර්මාන්තයක හෝ වෙළෙඳාමක නැතහොත් යම් අපනයන හෝ ආනයන ව්‍යාපාරයක නිරත වීම සහ කෘෂිකාර්මික, කාර්මික සහ වාණිජ්‍ය ව්‍යාපාර හා කර්මාන්ත ආරම්භ කොට පවත්වාගෙන යාමට තැනැත්තන්ට ආධාර දීම හෝ සහාය වීම සහ තාක්ෂණය සහ ශිල්පීය ක්‍රම ජනතාවට සාර්ථක ලෙස ලබා දීම සඳහා පුහුණු කිරීමේ වැඩසටහන් ව්‍යාප්ත කිරීම සේවාවෙන් සහ ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම;

(න) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමෙහි නිරතව සිටින ස්වේච්ඡා සේවකයන්ට සහ වෙනත් තැනැත්තන්ට ශිෂ්‍යත්ව මගින් හෝ මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර කිරීම;

(ප) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම, පොත්පත්, සඟරා, සමරු කලාප, වාරසඟරා, කැසට්පට, සංයුක්ත තැටි, මෘදුකාංග ආදියට දායක වීම සහ ඒවා නිකුත් කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා යෝග්‍ය වෙතැයි සලකනු ලබන වෙනත් සේවා සැලසීම;

(බ) ශ්‍රී ලාංකික, පෙරදිග හා අපරදිග ලලිත කලා ක්ෂේත්‍ර ප්‍රවර්ධනය සහ ඒ සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම;

(ම) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි ප්‍රදර්ශන, ව්‍යාපෘති, දේශන, සම්මන්ත්‍රණ, දාර්ශනික සාකච්ඡා, වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන, චාරිකා, විනෝද ගමන් හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම පිළියෙළ කිරීම, සංවිධානය කිරීම හා පැවැත්වීම හා පර්යේෂණ ආයතන පිහිටුවීම;

(ය) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ යම් දේශීය හෝ විදේශීය ආයතන හෝ සංවිධාන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ර) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් කීපයක් හෝ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය, හිතකර හෝ ආනුෂංගික හෝ විය හැකි වෙනත් සියලු දේ කිරීම.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:— සංස්ථාවේ සාමාන්‍ය බලතල.

(අ) අරමුදල් රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ආ) චංචල හෝ නිශ්චල දේපල කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම්

ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදි කිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස්කම් කිරීම;

(ඇ) විනිමය බිල්පත්. චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ නිකුත් කිරීමට සහ යම් බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වැසීම සහ ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන මුදල් කළමනාකරණ සභාව තීරණය කරන ආකාරයට ආයෝජනය කිරීම;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයක සංස්ථාගත කළ යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, මණ්ඩලයක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(ඊ) විවිධ සාමාජිකයන්ගේ වර්ගීකරණය කිරීම සඳහා ලියාපදිංචි වීමට ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම; සහ

(උ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, අධ්‍යක්ෂ ජනරාල්, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කරනු ලබන හත් දෙනකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, වෛද්‍යාචාර්ය පූජ්‍ය කොළඹිස්සේ ගුණරතන ස්වාමින් වහන්සේ සංස්ථාවේ යාවජීව අධ්‍යක්ෂ ජනරාල් විය යුතු අතර, උන්වහන්සේගෙන් පසු අධ්‍යක්ෂ ජනරාල් ධූරයට උන්වහන්සේගේ අනුප්‍රාප්තිකයා උන්වහන්සේ විසින් නම් කරනු ලැබිය යුතු ය. එසේ අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂ ජනරාල්වරයා ද යාවජීව අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් වන්නේ ය.

(3) සංස්ථවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද කළමනාකරණ මණ්ඩලය තෝරා පත්කර ගැනීම සඳහා සංස්ථාවේ නිළධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාමේ දී, අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ කටයුතු කරගෙන යාම සඳහා සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජික නාමලේඛනය.

**7.** (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව වූ දිනයේ දී කමිටුවේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් කළ යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු කළ යුතු ය.

(2) ලේඛනයේ පහත සඳහන් විස්තර ඇතුළත් විය යුතු ය:—

(අ) සංස්ථාවේ එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය සහ රැකියාව;

(ආ) යම් සාමාජිකයකුගේ නාම ලේඛනයේ සටහන් කරනු ලැබූ දිනය; සහ

(ඇ) යම් තැනැත්තකු සාමාජිකයකු වී සිටීම අවසන් වූ දිනය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල් හෝ ගාස්තු භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපල කවර ස්ථානයකින් උපලබ්ධි වුව ද, මෙහි දක්වා ඇති පරිදි, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක්ම යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපල වලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

සංස්ථාවේ විගණනය හා ගිණුම්.

**9.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලුම මුදල් පිළිබඳව නිසි අයුරින් ගිණුම් තැබීමට සංස්ථාව විසින් සැලැස්විය යුතු ය.

(2) සංස්ථාව විසින් පත්කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් යටත් පිරිසෙයින්, වර්ෂයකට එක් වරක් හෝ සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට, විගණනය කළ යුතු අතර, ආදායම් සහ වියදම් ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව ඔවුන් විසින් සහතික කළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේද යන බව.

**10.** සංස්ථාවේ අධ්‍යක්ෂ ජෙනරාල් හා ලේකම් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ

සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

*පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු මුදල්.*

**11.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින්, ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.*

**12.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක්, ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපලක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපල සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.*

**13.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**14.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.